ලිංගික අපරාධයකට මුහුණ දුන් අය වෙත මාධ්‍ය වාර්තාවන් ඔස්සේ සිදුවීම පිළිබඳ දෝෂාරෝපණය එල්ල කිරීමේ ඇති ගැටළුව වන්නේ, ඒ ඔස්සේ එවැනි අපරාධ සාමාන්‍යකරණය වීමටත්, එවැනි අපරාධයන් සාධාරණීකරණය කෙරෙනා සමාජ ආකල්පයක් ඇති වීමටත් ඉඩ කඩ පැවතීමයි. විශේෂයෙන්ම බාලවයස් අයෙකු සිය කැමැත්තෙන් ලිංගික හැසිරීමකට ගිය විටකදී වුවත්, එය ලිංගික අපරාධයක් ("ව්‍යවස්ථාපිත දූෂණයක් ලෙස නීතියේ සඳහන් කෙරේ) ලෙසින් නීතිය හඳුනාගන්නා බව මෙහිදී පැවසිය යුතුයි.

මීට උදාහරණයක් ලෙස, 13 හැවිරිදි බාලවයස්කාර පාසල් ශිෂ්‍යාවක් ලිංගික අපයෝජනයට ලක් කළ බවට සැකපිට 17 හැවිරිදි පාසල් සිසුවෙකු මහවිලච්චිය පොලිසිය විසින් අත්අඩංගුවට ගැනීම සම්බන්ධ පුවත, සැප්.15, 2022 දින විවිධ මාධ්‍ය ඔස්සේ වාර්තා කෙරී ඇති ආකාරය පෙන්වා දිය හැක.

දිවයින - "විදුහල්පතිගේ 'හලෝ' එකෙන් දැරියගේ රංගනය හමාරවෙලා" (පුවත තුළ මෙය අපහරණයක් ලෙස දක්වයි.)

දිනමිණ - "13 හැවිරිදි පෙම්වතිය කෙලෙසූ 17 හැවිරිදි පෙම්වතාට මාංචු" (පුවත තුළ දූෂණයක් යැයි දක්වයි.)

අද - "පාසල් දැරියක අපයෝජනය කළැයි පාසල් සිසුවෙක් දැලේ" (පුවත තුළ ද මෙය අපයෝජනයක් ලෙසින්ම දක්වයි.)

1) ඔබ සිතන ලෙසට, "විදුහල්පතිගේ 'හලෝ' එකෙන් දැරියගේ රංගනය හමාරවෙලා" යන දිවයින සිරස්තලයෙන්, මෙම ලිංගික අපයෝජනයට ලක්වූ බාලවයස් දැරියට වක්‍රාකාරව දොස් පැවරීමක් සිදු නොවන්නේ ද?

2) ලිංගික අපරාධයකට මුහුණ දුන් අයෙකු අපවිත්‍ර වී ඇතැයි ගම්‍ය කරනා "කෙලෙසීම", "දූෂණය" වැනි යෙදුම් වලට වඩා, "ලිංගික අපයෝජනය", "ලිංගික අපරාධය" වැනි යෙදුම් වඩාත් යෝග්‍ය නොවන්නේ ද?

3) ඒ අනුව, වඩාත් ආචාර ධාර්මික වාර්තාකරණය ලෙසින් ඔබ තෝරාගන්නේ මින් කුමන පුවත ද?

ලිංගික අපරාධයකට මුහුණ දුන් බාලවයස්කරුවන්ට දෝෂාරෝපණය නොකරමු! ලිංගික අපරාධයකට මුහුණ පෑවෙකු අපවිත්‍ර වූ බවක් හඟවන යෙදුම් භාවිතයෙන් වළකිමු!